# කේරළයේ ඊළවාස ජනයාගේ සිංහල සම්භවය පිළිබඳ සංස්කෘතික හා දේශපාලන බලපෑම

එන්.එස්. සේනානායක[1]

ඊළ, ඊළම් යන වචනය පුරා වසර 35 කට අධික කාලයක් ලංකාව තුළ පැවති ඊළාම් බෙදුම්වාදී ව්‍යාපාරය තුළ තර්කයට ලක් වූ මතභේදාත්මක වචනයකි. ඒ සම්බන්ධ වන දරන්නන් දකුණු ඉන්දීය සෙල්ලිපි කිහිපයක් උපුටා දක්වමින් ක්‍රියා සිටින්නේ පුරාණ ලංකාව තුළ ඊළාම් නැමැති වෙනම රාජ්‍යයක් පැවත ඇති බවය. ඔවුන් මේ සම්බන්ධ ඉදිරිපත් කරන ප්‍රධානම සාක්ෂිය ක්‍රි.පූ පළමු වැනි සියවසේ ලියවුණු තිරුප්පන්කුන්රාම් හි ඇති බ්‍රාහ්මිය සෙල්ලිපියකි. එහි පාදක සටහන් තුළ ඊළ යන වචනයට දෙමළ සාහිත්‍යය තුළ පවතින නිරුක්තීන් කිහිපයක් පවතී. නමුත් තිරුප්පන්කුන්රාම් සෙල්ලිපිය උපුටා දක්වමින් වැරදි අර්ථයකින් ඊළාම් නම් වෙනම රාජ්‍යයක් ලංකාව තුළ පැවති බව කියන ඊළ යනු රා මදින්නන්ගේ කුලය යන නිරුක්තිය සගවා තබයි. මහාවංසය හෝ යාපන වංසකතාව තුළ ඊළම් යැයි වෙනම රාජ්‍යයක් තිබූ බවට සාක්ෂි නොවන අතර එළු සඳැස් ලකුණ ඊළ යනු හෙළය එනම් සමස්ත ලංකාවම යන අදහසට සාක්ෂි දරයි. මෙය තවදුරටත් පැහැදිලි කරගත හැක්කේ කේරළයේ ඊළවාස (Ezhavas) ජනයාගේ සිංහල සම්භවය පිළිබඳ අධ්‍යයනකට හසුකර ගැනීම තුළය. කේරළයේ වෙසෙන ඊළවාස ජනතාව භාෂ්කරවර්ම රාජ්‍ය සමය තුළ චේර රාජ්‍යයට යුධ ආධාර පිණිස ලංකාවෙන් යැවූ බටපිරිස්වලින් පැවතෙන්නන් වන අතර කේරළයට පොල් වගාව ව්‍යාප්ත කරන්නේ ද ලංකාවෙන් සංක්‍රමණය වුවන්ගෙන් පැවතෙන ඊළවාස් ජනතාව බවට ප්‍රවාද වෙති. මෙතෙක් දෙමළ නිජබිම් සංකල්පය තුළ යෙදෙන ඊළාම් යන වචනයේ පැහැදිලි නිරුක්තියක් හා ඒ සම්බන්ධ කේරලයේ ඊළවාස ජනයාගේ සිංහල සම්භවය පිළිබඳ ශාස්ත්‍රිය මට්ටමෙන් කෙරෙනු විග්‍රහයන් අල්පය. මෙම අධ්‍යනයේ අරමුණ වන්නේ මෙතෙක් අවධානයට හසු නොවූ කේරළයේ ඊළවාස් ජනයාගේ සිංහල සම්භවය පිළිබඳ විඥානයේ සංස්කෘතික හා දේශපාලන බලපෑම අධ්‍යයනට හසුකර ගැනිමය. ඒ හරහා මතභේදයක්ව පවතින ඊළාම් නිජබිම් සංකල්පය ශාස්ත්‍රියව අභියෝගයට ලක්කරනු ලැබේ. මෙහිදී දත්ත රැස්කිරීම ද්විතික මුලාශ්‍ර පදනම්ව සිදුකර ඇත. එහිදි සාහිත්‍ය විමර්ශන සඳහා ඓතිහාසික මුලාශ්‍රය කිහිපයක් මත පදනම්ව අධ්‍යයන සිදුවේ. එම මුලාශ්‍රයවල කාල නිර්ණයන් හා සිද්ධි සමගත කිරීම තුළින් උක්ත අධ්‍යන තේමාව පිළිබඳ නව වපසරියක් ගොඩනගා ඇත. එම වපසරිය තුළ උපකල්පනය කළ කරුණු කාලනීර්ණ හා සිද්ධි අනුව ප්‍රත්‍යක්ෂ කර ඇත. මෙම අධ්‍යයනය සමාජගත වීම හරහා සිදුවන ඊළාම් නිජබිම් සංකල්පය ශාස්ත්‍රියව බැහැරවීම තුළ තවදුරටත් විජාතිය බල ව්‍යපෘති විසින් පෝෂණය කරන බෙදුම්වාදී ව්‍යාපාර ගොඩනගන මතය නිශේදනය වී යනු ඇත.

ප්‍රමුඛ පද : ඊළවාස ජනයා, සිංහල සම්භවය, කේරලය, සෙල්ලිපි

[1] සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. nadeesena94@gmail.com